ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

**<u>මහව - අනුරාධපුර දුම්රිය මාර්ගයේ සංඥා සහ විදුලි සංදේශ ව්‍යාපෘතිය සඳහා පළමු වාරිකය නිකුත් කෙරේ</u>**

ඉන්දිය රජය විසින් මහව - අනුරාධපුර දුම්රිය මාර්ගය සඳහා වැඩි දියුණු කරන ලද සංඥා සහ විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතියේ පළමු වාරිකය ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 2.5ක පමණ (ශ්‍රී ලංකා රුපියල් මිලියන 770ක් පමණ) මුදලක් නිකුත් කර තිබේ. මෙය දුම්රිය ක්ෂේත්‍රය තුළ ඉන්දියා - ශ්‍රී ලංකා සහයෝගීතාවයේ තවත් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

2. මෙම ව්‍යාපෘතිය ඉන්දිය අග්‍රාමාත්‍යතුමා 2025 අප්‍රේල් මස සිදු කරන ලද ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී එතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් දියත් කරන ලදී. ඇමරිකානු ඩොලර් මිලියන 14.89ක පිරිවැයක් සහිත ව්‍යාපෘතිය මුලදී ණයක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර පසුව ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ 2024 දෙසැම්බර් ඉන්දිය සංචාරය අතරතුර ඉන්දිය රජය විසින් ප්‍රදානයක් බවට පත් කරන ලදී. එම ව්‍යාපෘතිය ඉන්දිය රජයේ සමාගමක් වන Ircon International Limited විසින් ක්‍රියාවට නංවයි.

3. ඉන්දිය සහයෝගය සහිතව උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය මාර්ගයන් පැයට කිලෝ මීටර් 100ක් දක්වා වේගයෙන් දුම්රිය ධාවනය කළ හැකි ලෙස නවීකරණය කර ඇත. එසේම, වැඩි දියුණු කරන ලද සංඥා පද්ධතිය මගී සුරක්ෂිතතාවය සහතික කරනු ඇති අතර දුම්රිය ක්‍රියාත්මක කරන වාර ගණන ද සේවාවේ කාර්යක්ෂමතාවය ද ඉහළ නංවනු ඇත. මෙම පද්ධතිය එක් එක් කොටස තුළ දුම්රිය තිබෙන ස්ථානය තත්කාලීන අයුරින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන අතර නවීන පාලන මධ්‍යස්ථානයක් තුළින් මධ්‍යගතව සමස්ත කොටසම අධීක්ෂණය කිරීමට ද අවස්ථාව ලබා දෙයි. එසේම මෙම පද්ධතිය දුම්රිය ස්ථානයන්හිදි එකම වේලාවක දී දුම්රිය ළඟා වීමට සහ පිටත් වීමට පහසුකම් සලසන අතර දුම්රිය ප්‍රමාදයන් අවම කරමින් මෙහෙයුම් කටයුතු ප්‍රශස්ථ කරයි. ව්‍යාපෘතියේ මූලික කටයුතු මේ වන විටත් අරඹා තිබෙන අතර ව්‍යාපෘතිය 2026 අගෝස්තු මාසයේදී සම්පූර්ණ කිරීමට නියමිතය.

4. දුම්රිය ක්ෂේත්‍රය ඉන්දියා - ශ්‍රී ලංකා සංවර්ධන සහයෝගීතාවයේ අතිශය වැදගත් අංශයකි. ඉන්දියාව ශ්‍රී ලංකාවේ දුම්රිය යටිතල පහසුකම් ව්‍යාපෘතීන් රැසකටම සහයෝගය ලබා දී තිබේ. මෙම ව්‍යාපෘතීන් අතර දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, දුම්රිය ලබා දීම, සහ සංඥා පද්ධතීන් ස්ථාපනය කිරීම වැනි විවිධ ව්‍යාපෘතීන් වේ. ඉන්දියාව ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රය සඳහා සමස්තයක් ලෙස ලබා දී ඇති මූල්‍ය සහයෝගය ඇමරිකානු ඩොලර් බිලියන 1.2ක් පමණ වේ. මේ දක්වා ඉන්දියාව කිලෝ මීටර් 500කට ආසන්න දුම්රිය මාර්ග ඉදි කර සහ ප්‍රතිසංස්කරණය කර ඇති අතර කිලෝ මීටර් 400ක පමණ දුම්රිය ජාලයක් සඳහා සංඥා සහ විදුලි සංදේශ පද්ධතීන් ස්ථාපනය කර ඇත. මෙවැනි ව්‍යාපෘතීන් තුළින් ඉන්දියාව උතුරු - දකුණු සම්බන්ධතාවය ඉහළ නැංවීමට දායකත්වය ලබා දී ඇත. මෙයට අමතරව, ඉන්දියාව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ධාරිතාවය තවදුරටත් ශක්තිමත් කරමින් දුම්රිය එංජින්, ඩීසල් බහු ඒකක සහ දුම්රිය මැදිරි ද සපයා ඇත.

5. මෙම ව්‍යාපෘතිය ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතා මුලපිරීම්වල ජනතා කේන්ද්‍රීය ප්‍රවේශය පිළිබිඹු කරන අතර ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය සහ යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා ඉන්දීය රජයේ ශක්තිමත් කැපවීම ද අවධාරණය කරයි.

***

**කොළඹ**
***2025* ජූලි *31***